සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සතිය - 2

විෂය - බුද්ධ ධර්මය | ශ්‍රේණිය - 5 | 2021 අගෝස්තු මාසය

සැකසුම : ඉරේෂා නිල්මිණි මිය - බලන්ගොඩ අධ්‍යාපන කලාපය

## 11.සම්මෝදමාන ජාතකය

ආදර දුවේ පුතේ අපි ජීවත් වෙනව කියන්නේ අභියෝග ජය ගැනීමක්.ඉතින් අපට නිතර හමුවන අභියෝග පහසුවෙන් ජය ගැනීමට සමගියෙන් කටයුතු කිරීම ඉතාම වැදගත් වෙනවා.ඉතින් මම අද ඔයාලත් එක්ක කතා කරන්නේ ඒ වගේ සමගියෙන් කටයුතු කර ජයග්‍රහණය කළ අවස්ථාවක් ගැනයි.

ඔයාල ආසයි නේද ඒ අවස්ථාව දැන ගන්න.

එක කාලෙක අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ තම නෑදෑයින් අතර ඇති වූ අසමගියක් අරඹයා තමයි මෙම අතීත කතා පුවත දේශනා කළේ.

ඉතින් ඒ ලස්සන කතා පුවත ගැන වැඩි විස්තර දැන ගැනීමට පුතාලගේ බුද්ධ ධර්මය පෙළපොතේ 11 වන පාඩම නිදහස් තැනකට ගිහින් කියවමු නේද?

ඉතින් මගෙ පුතාල ඒ පාඩම හොඳින් කියවා ගත්තා නේද? දැන් ඉතින් පුළුවන්ද බලන්න පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

1.ඔබ මීට පෙර උගත් ජාතක කතා මොනවාද?

2.සම්මෝදමාන ජාතක කතාව තුළ දී අපට හමුවන චරිත මොනවාද?

3.මෙහි සඳහන් වටු කුරුලු නායකයා ලෙස ඉපදී ඇත්තේ කවුද?

4.වටු වැද්දාගේ බේරීමට වටු කුරුලු නායකයා සතු උපාය කුමක්ද?

5.දින කීපයක්ම වටු වැද්දාට හසු නොවී දිවි බේරා ගන්නේ කෙසේ කටයුතු කිරීමෙන්ද?

දුවේ පුතේ සම්මෝදමාන ජාතකය හොඳින් කියවා අවබෝධ කර ගෙන අපිත් සමගි වෙලා ජය ලබමු.